## එක්සත් ජාතික පක්ෂය නිකුත් කළ
## විශේෂ නිවේදනය

සටන් විරාම ගිවිසුම අහෝසි කරන බවට ජනතාව හමුවේ පොරොන්දු වී 2005 වසරේ නොවැම්බරයේ බලයට පත් මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ ආණ්ඩුව 2006 පෙබරවාරියේ ජිනීවා නුවරදී සටන් විරාම ගිවිසුම අඛණ්ඩව ඉදිරියට ගෙන යන බවට ලිඛිතව ම සහතික විය.

2006 ඔක්තෝබර් මාසයේ එක්සත් ජාතික පක්ෂය සමග අවබෝධතා ගිවිසුම අත්සන් කරමින් සටන් විරාම ගිවිසුමෙහි සඳහන් "දේශපාලන විසඳුම" වෙනුවෙන් කැපවී ක්‍රියාකරන බවට ද ආණ්ඩුව පොරොන්දු විය.

සටන් විරාම ගිවිසුම නීත්‍යානුකූල බව ශ්‍රේෂ්ඨාධිකරණය මේ වන විටත් ප්‍රකාශ කර තිබිණි.

එවන් පසුබිමෙක සටන් විරාම ගිවිසුමන් ඉවත්වීමට ආණ්ඩුව හදිසියේ ම තීරණය කොට ඒ බව ජනවාරි 03 වන දා නිල වශයෙන් නෝර්වේ රාජ්‍යය වෙත දැනුම් දී තිබේ.

2005 වසරේ සටන් විරාම ගිවිසුමෙන් ඉවත් වන බවට ජනතාවට පොරොන්දු වූ රාජපක්ෂ ආණ්ඩුව, 2006 වසරේ දේශපාලන විසඳුමක් වෙනුවෙන් කැපවී ක්‍රියාකරන බවට සහතික වූ රාජපක්ෂ ආණ්ඩුව, වසර 3 කට පසු සටන් විරාම ගිවිසුමෙන් ඉවත් වුණේ මන්ද යන්න අද රට හමුවේ ඇති තියුණු ප්‍රශ්නයයි.

<u>එම ප්‍රශ්නයට පිළිගත හැකි පිළිතුරක් සැපයීමට ආණ්ඩුව තවමත් අපොහොසත් වී තිබේ. ඒ නිසා මේ තීරණය ගෙන ඇත්තේ හුදු තම බලය රැක ගැනීම සඳහා ජනතා විමුක්ති පෙරමුණේ හා ජාතික හෙළ උරුමයේ ඉල්ලීම් වලට එකඟවීමෙන් බව පැහැදිලිය. මෙමගින් පිළිබිඹු වනුයේ රට ආරක්ෂා කරලීම පසෙක ලා තමන්ගේ වාසියට ප්‍රමුඛතාවය ලබා දී ඇති බවය.</u>

එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව සටන් විරාම ගිවිසුමට එළැඹුනේ රට යුධමය හා ආර්ථික වශයෙන් අතිශය අනතුරුදායී තලයකට ඇද වැටී තිබුණු අවස්ථාවකදීය.

ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන්හි ප්‍රධාන යුධ කඳවුරු ගණනාවක් එල් ටී ටී ඊ සංවිධානය අතට පත්ව තිබිණි. කටුනායක ගුවන් තොටුපලට එල් ටී ටී ඊ සංවිධානය පහර එල්ල කොට තිබිණි. වරාය වැනි ආර්ථික මර්මස්ථාන ගණනාවක් අඩපණ කරන්නට එල් ටී ටී ඊ සංවිධානය සමත් ව තිබිණි. රටේ ආර්ථිකය සම්පූර්ණයෙන් ම කඩා වැටී වර්ධන වේගය ඍණ අගයක් දක්වා අඩුවී තිබිණි.

එවන් පසුබිමෙක අත්සන් කෙරුණු සටන් විරාම ගිවිසුමෙහි මූලික පරමාර්ථය වූයේ උතුරු නැගෙනහිර අර්බුදයට දේශපාලන විසඳුමක් ලබා ගැනීම හා දේශයේ භෞමික අඛණ්ඩතාව ආරක්ෂා කිරීමය. විදේශීය රටවල් හා ජාත්‍යන්තර සංවිධාන 67 ක් සටන්

විරාම ගිවිසුම ඔස්සේ භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා කිරීම හා දේශපාලන විසඳුමක් ලබා ගැනීම සහතික කරමින් එය පිළිගත්හ.

ආර්ථිකය පිබිදෙන්නට විණි. ජීවන බර සැහැල්ලු විණි. ඩොලරයක අගය රුපියල් 93 ක් දක්වා පහළ වැටෙමින් රුපියල ශක්තිමත් කෙරිණි. රට ම සහලින් ස්වයංපෝෂිත විණි. ආයෝජනකයින් වැඩි වැඩියෙන් පැමිණමත් සමග ම නව රැකියා අවස්ථා නිර්මාණය කෙරිණි. අමෙරිකානු මිලේනියම් චැලෙන්ජ් අරමුදලේ ආධාර ශ්‍රී ලංකාවට ලබා දීමට කටයුතු කෙරිණි. ටෝකියෝ ආධාර සමුළුවේදී ඩොලර් කෝටි 45000 ක ආධාර මුදලක් අපට ලබා දීමට එකඟත්වය පළ කෙරිණි.

වසර ගණනාවක් තිබූ ආයුධ තහනම ඉවත් කොට අමෙරිකාව, ඉන්දියාව හා එක්සත් රාජධානිය අපට යුධ පුහුණුව, උපදෙස් හා අවි ආයුධ ලබා දෙන්නට එකඟ විණි. ත්‍රස්තවාදී කටයුතු මැඩලීම උදෙසා ජාත්‍යන්තර බුද්ධි අංශ තොරතුරු අප වෙත ලැබිණි. මෙහි සංකේතයක් ලෙස ඇමෙරිකාවෙන් යුධ නැවක් නොමිලයේ ලැබිණි.

එසේ රට ශක්තිමත් වන අතරතුර අපි දේශපාලන විසඳුමක් සඳහා සාකච්ඡා ඉදිරියට ගෙන ගියෙමු. ඔස්ලෝ සාකච්ඡා වාරයේදී වෙනම රාජ්‍යයක් වෙනුවට විකල්ප ක්‍රමවේදයක් සෙවීම සඳහා සාකච්ඡා කිරීමට එල් ටී ටී ඊ සංවිධානය එකඟ කරවා ගැනීමට අපට හැකිවිය.

මේ සටන් විරාම ගිවිසුම නිසා රට එක්සේසත් කරන පරිසරයක් නිර්මාණය විය. සිංහල ද්‍රවිඩ හා මුස්ලිම් ජනතාවට උතුරට හා දකුණට ගමන් කිරීමට හැකි විය. සියලුදෙනා තුළ ශ්‍රී ලාංකික යන හැඟීම බිහි විය.

කොටි සංවිධානයේ අන්තවාදීහු දේශපාලන විසඳුමක් කරා යන මාවතෙන් පිට පැන 2003 වසරේ අප්‍රේල් මාසයේ දී සාකච්ඡා මේසයෙන් ඉවත් වන ලදී. සාකච්ඡා මේසයෙන් ඉවත් වීමට එල් ටී ටී ඊ සංවිධානය තීරණය කළද, ජාත්‍යන්තර බලපෑම් මත නැවත සාකච්ඡාවට පැමිණීමට එකඟ වන්නට ඔවුනට සිදු විය. 2003 වසරේ ජූලි මාසය වන වන විට සටන් විරාම ගිවිසුම උල්ලංඝණය කිරීම ඉතා අවම තලයකට පත් විණි. එහෙත් එජාප ආණ්ඩුව විසිරුවා හැරීම නිසා දේශපාලන විසඳුම් මාර්ගය ඔස්සේ ඉදිරියට යෑමේ අවකාශයක් අහිමි විය.

මුළු මහත් ජාත්‍යන්තර ප්‍රජාව ම පෙනී සිටියේ සටන් විරාම ගිවිසුම වෙනුවෙනි. සටන් විරාම ගිවිසුම මගින් තමන් ජාත්‍යන්තර ආරක්ෂක දැලකට හසු කළ බව එල් ටී ටී ඊ සංවිධානය අවස්ථා ගණනාවකදී ප්‍රකාශ කළේ එබැවිනි. මීට කලින් ශ්‍රී ලංකා ආණ්ඩුව සමග ඇති කරගත් සටන් විරාම ගිවිසුම් වලින් ඈත් වුවද, මෙම සටන් විරාම ගිවිසුමෙන් ඈත් වීමට එල් ටී ටී ඊ සංවිධානයට නො හැකි වූයේ ඔවුන්ට සාමකාමී විසඳුමක් උවමනා නොවන බව සනාථ වී ජාත්‍යන්තර වශයෙන් විශාල බලපෑමකට මුහුණ දීමට සිදුවන බව දැන අවබෝධ කොට ගෙන සිටි බැවිණි.

දැන් සටන් විරාම ගිවිසුමෙන් ඉවත් වීමේ වගකීම ශ්‍රී ලංකා ආණ්ඩුව තමන්ගේ කරපිට පටවා ගෙන තිබේ. ඒ ඔස්සේ ශ්‍රී ලංකාවට ශේෂ වී ඇත්තේ ජාත්‍යන්තර අප්‍රසාදයයි.

ජාත්‍යන්තර වශයෙන් දැනටමත් මේ තීරණය හෙළා දැකීමට පත්ව තිබේ. අමෙරිකාව, ජපානය, ඉන්දියාව වැනි මිත්‍ර රටවල් ගණනාවක් මෙන් ම එක්සත් ජාතීන්ගේ සංවිධානය ද සිය අප්‍රසාදය පළ කර ඇත. ආධාර දෙන රටවලද ආකල්පය එයමය.

ඒ අප්‍රසාදය තව තවත් වැඩි දියුණු වන්නේ රාජපක්ෂ ආණ්ඩුව මෙම තීරණයට එළැඹුනේ බලය බෙදා හැරීමේ විසඳුමක් ඉදිරිපත් කරන බවට මුළු මහත් ජාත්‍යන්තර ප්‍රජාව ඉදිරියේ අවස්ථා ගණනාවකදී ම ප්‍රතිඥා දීමෙන් පසුව බැවිනි.

විදේශීය රටවල් සහ ජාත්‍යන්තර සංවිධාන ශ්‍රී ලංකාව කෙරෙහි තබා තිබුණු විශ්වාසයේ අවසන් රැහැන ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ම සිඳ ගෙන තිබේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස ජාත්‍යන්තර සහය රටට නො ලැබී යනු ඇති අතර, ශ්‍රී ලංකාව වෙනුවෙන් ක්‍රියාත්මක වූ ඒ රටවල් වල තිබෙන බලවේගයන් ද දුර්වල වී යනු ඇත.

සටන් විරාම ගිවිසුමෙන් ඉවත් වීමත් සමග සිවිල් යුද්ධයක් පවතින අනතුරුදායක රටක් ලෙස සමහර රටවල් ශ්‍රී ලංකාව යළිත් වර්ග කෙරනු ඇත.

අපට ලැබෙන ආධාර අඩුවී ආයෝජකයින්ගේ පැමිණීම අවසන් වනු ඇත. පැමිණි ආයෝජකයින් රට හැර යනු ඇත. යුධ ආධාර හා උපකරණ සැපයීම නවතිනු ඇත. මෙහි සමස්ත ප්‍රතිඵලය වනුයේ ජාත්‍යන්තර තලයේදී ශ්‍රී ලංකාව දුර්වල වී ඒ කඩා වැටීමෙන් පමණක් ම එල් ටී ටී ඊ සංවිධානය ජාත්‍යන්තර වශයෙන් විශාල වශයෙන් ශක්තිමත් වීමය.

එපමණක් නොවේ. යථාර්ථය තව තවත් භයානකය.

වෙනත් රටවල සටන් විරාම ගිවිසුම් මෙන් නොව ශ්‍රී ලංකාවේ ඇතිකරගත් සටන් විරාම ගිවිසුම සුවිශේෂී එකකි. වෙනත් රටවල මෙවැනි ගිවිසුම් ඇති කර ගැනීමේදී සටන් වදින දෙපාර්ශවයේම හමුදාවන් සැලකුයේ එකම මට්ටමකිනි. එහෙත් මෙම ගිවිසුමෙහි 1.3 වගන්තිය අනුව ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාව ආරක්ෂා කිරීමේ පරම අයිතිය ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන්ට හිමිවී තිබිණි. මෙම අයිතිය ශ්‍රී ලංකා ආණ්ඩුව පමණක් නොව එල් ටී ටී ඊ සංවිධානය ද සටන් විරාම ගිවිසුම මගින් පිළිගෙන තිබිණි.

සටන් විරාම ගිවිසුම පදනම් කර ගනිමින් සාම සාකච්ඡා කරා එළැඹෙද්දී එල් ටී ටී ඊ සංවිධානයට ද, ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන්ගේ අයිතිය පිළිගෙන කටයුතු කිරීමට සිදුවූයේ මේ නිසා ය.

විදේශ ඇමතිවරයා හා ජනමාධ්‍ය ඇමතිවරයා පවසන ආකාරයට සටන් විරාම ගිවිසුම නැතිව යළි සාම සාකච්ඡා ආරම්භ කිරීමට ජනාධිපති මහින්ද රාජපක්ෂ සූදානම්ය. එවිට ශ්‍රී ලංකාවට ඊට සහභාගී වීමට සිදුවන්නේ පෙර කී තත්වයට වඩා ඉඳුරා ම වෙනස් පදනමක සිටය. සාකච්ඡා මේසයේදී ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන් ඉහළ තලයකින් පිළිගැනීමේ අවශ්‍යතාවය දැන් ආණ්ඩුව විසින් ම නැති කර ගෙන තිබේ.

එබැවින් ඉදිරියේදී ජාත්‍යන්තර ප්‍රජාවට හා එල් ටී ටී ඊ සංවිධානයට ශ්‍රී ලංකා හමුදාවන්ගේ පරම අයිතිය පිළිගැනීමට අවශ්‍යතාවක් නොමැත. මේ උදාවී ඇත්තේ පැරණි යුගෝස්ලාවියාවේ උද්ගත වූ තත්වය මය. ශ්‍රී ලංකාව ඉදිරියේදී සාකච්ඡාවට යා යුත්තේ ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාව සහ කොටි හමුදාව සමාන තත්වයේ ලා සලකාලමිනි. මෙය ඉතා බරපතල තත්වයකි. ඒ බරපතල තත්වය ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ම ඇති කර ගත්තකි.

සටන් විරාම ගිවිසුමෙන් ඉවත් වීම නිසා දේශීය වශයෙන් අප ලබන්නා වූ කිසිදු වාසියක් නොමැත්තේය. ශ්‍රී ලංකා හමුදාවන්හි අයිතිය පිළිගැනීම ආණ්ඩුව විසින් ම ප්‍රතික්ෂේප කර ඇති නිසා හමුදාවටවත්, හමුදා සෙබළුන්ටවත් අත්වන වාසියක් හෝ ශක්තියක් හෝ නොමැත.

සටන් විරාම ගිවිසුම ඔස්සේ දේශපාලන විසඳුමක් කරා ගමන් ඇරඹීත් සමග ජනතාව අතර දළු ලා වැඩෙන්නට ගත් ශ්‍රී ලාංකේය අනන්‍යතාව පිළිබඳ විශ්වාසය බිඳ වැටීමට මේ තීරණය හේතු වීම ද කණගාටුවට කරුණකි.

ජාත්‍යන්තර වශයෙන් හා දේශීය වශයෙන් පමණක් නොව සාකච්ඡා මේසයේදී ද අප දුර්වල තලයකට පත් කෙරෙන මෙවැනි අදූරදර්ශී තීරණයක වාසිය ලැබෙනුයේ වෙනම රාජ්‍යයක් අපේක්ෂා කරන, ආණ්ඩුව හරහා ශක්තිමත් වුණු එල් ටී ටී ඊ සංවිධානයටය. රටටත්, ජනතාවටත් මෙම තීරණයෙන් අත්වන යහපතක් හෝ වාසියක් හෝ නොමැත. වෙනම රාජ්‍යයක් සඳහා එල් ටී ටී ඊ සංවිධානයට ජාත්‍යන්තර වාසිදායී පරිසරයක් ඇතිකරවා දුන් මෙම තත්වයට ආණ්ඩුව වගකිව යුතුය.

යුධ උන්මාදයෙන් හා ලේ පිපාසාවෙන් පරළ වූ පාලකයින්ට යථාර්ථය දැකිය නො හැකිය. දේශීය හා විදේශීය අතීත අත්දැකීම් ග්‍රහණය කර ගත නො හැකිය.

ත්‍රස්තවාදයට ආරක්ෂමය පියවර ගන්නා අතර සෑම ජන කොටසකට ම පිළිගත හැකි දේශපාලන විසඳුමක් මගින් මෙරටට තිරසාර සාමය උදාකර ගත යුතු බව එක්සත් ජාතික පක්ෂයේ විශ්වාසයයි. ත්‍රස්තවාදය සහමුලින් ම පරාජය කළ හැක්කේ ප්‍රජාතන්ත්‍රවාදයෙන් බව අපගේ ඇදහිල්ලයි. වෛරයෙන් වෛරය හෝ ත්‍රස්තවාදය ත්‍රස්තවාදයෙන් හෝ සහමුලින් ම පරාජය කළ නො හැකි බව බුදුන් වහන්සේ පෙන්වා දුන්නේ මීට වසර 2550 කට ත් පෙරදීය. එහෙයින් මේ අර්බුදයට විසඳුම් සෙවිය යුත්තේ සාකච්ඡාවෙන් හා සම්මුතියෙනි. ලෝකයේ සෑම රටක ම මෙවැනි ගැටළු විසඳා ඇත්තේ ඒ ආකාරයෙනි. එවැනි පරිණත විසඳුමක් සඳහා අපගේ සහය සැමවිට ම ලබා දීමට අප සූදානම් ය.

එහෙත් තමන්ගේ බලය ආරක්ෂා කරලීම සඳහා රටේ අනාගතය පරදුවට තබන්නා වූ තීරණයන් හමුවේ නිහඬව සිටීමට අපට නො හැකිය. මෙම තීරණය වෙනම රාජ්‍යයක් එල් ටී ටී ඊ සංවිධානය ට ලබා දීමේ වැදගත් පියවරක් බවට පත් වී ඇත.

සටන් විරාම ගිවිසුම අහෝසි කිරීමේ සිහින මායාවේ විචිත්‍රත්වය විඳින්නන් අතරේ උඩුගං බලා පිහිනමින් මෙහි කටුක යථාර්ථය පෙන්වා දෙන්නට එක්සත් ජාතික පක්ෂය නො බියව ඉදිරිපත් වන්නේ එබැවිනි.

මුළු රටත්, ජාතියත්, දේශයේ අනාගතයත්, අතිශය අනතුරුදායක හා අවාසිදායක තලයකට ඇද දමමින් සටන් විරාම ගිවිසුම අහෝසි කළේ ඇයි?

ආණ්ඩුව දේශපාලන විසඳුමක් කරා යොමු වන්නේ මේ අවාසිදායක තලයේ සිටිමින්ද?

මේ බරපතල ප්‍රශ්නයන්ට පැහැදිලි පිළිතුරු ලබා දීම ආණ්ඩුවේ වගකීමකි.

2008 ජනවාරි 06